## ධීවර ,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය

## පිරිසිදු කිරීමේ සේවාව පවත්වා ගෙන යාම සඳහා ලංසු කැඳවීම 2025/2026

- කොළඹ 10 , මාළිගාවත්ත, නව මහලේකම් කාර්යාලයේ පිහිටි මහල් 07 කින් යුත් ගොඩනැගිල්ලේ පිහිටි ධීවර ,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සහ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවට අයත් කාර්යාල පරිශ්‍රය 2025.08.01 දින සිට එක් වර්ෂයක් තුල පිරිසිදු කිරීමේ සේවාව පවත්වාගෙන යාම සඳහා පහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන පිළිගත් ලංසුකරුවන්ගෙන් පමණක් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් 2025. 07.21 වැනි දින ප.ව. 2.00 දක්වා මුද්‍රා තබන ලද ලංසු භාර ගැනීම සිදු කෙරේ.

1. ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ ලියාපදිංචි වී තිබීම.

2. රාජ්‍ය අංශයේ / පෞද්ගලික අංශයේ අවම වශයෙන් වසර 02 ක අදාල ක්ෂේත්‍රයේ සතුටුදායක පළපුරුද්දක් තිබීම.(අවම වශයෙන් සේවකයන් 20 ක් සේවයේ යොදවා ඇති ආයතන විය යුතුය)

3. 2025. 07.07 සිට 2025.07.18 දක්වා පෙ.ව.10.00 සිට ප.ව.3.00 දක්වා කොළඹ 10, මාලිගාවත්ත,නව මහලේකම් කාර්යාලයේ ධීවර ,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ 02 වන මහලේ මුදල් අංශයේදී අදාළ ලංසු ලේඛන ගාස්තු ගෙවීමකින් තොරව පරීක්ෂා කර බැලිය හැකිය.

4. 2025.07.18 දින පස්වරු 3.00ට පෙර ගණකාධිකාරි (සැපයීම්) වෙතින් ලංසුකරුගේ ලිපි ශීර්ෂයක ලිඛිතව ඉල්ලුම්කර ලබා ගන්නා ආකෘති පත්‍රවල පමණක් ලංසු පිළියෙළ කර ඉදිරිපත් කල යුතු අතර එම ආකෘති පත්‍ර ලබාගැනීම සඳහා ආපසු නොගෙවන රු. 2500.00 ක මුදලක් මෙම අමාත්‍යාංශයේ සරප් වෙත ගෙවා කුවිතාන්සි ඉදිරිපත් කල යුතුය.

5. ලංසුකරු ස්වකීය ලංසුව සමඟ රු. 100,000.00 (රුපියල් ලක්ෂයක) ක් වටිනා ශ්‍රී ලංකාවේ පිළිගත් වාණිජ බැංකුවකින් ලබා ගත් ඉල්ලීම මත ගෙවීම් කරනු ලබන ලංසු ඇපකරය /බැංකු ඇපකරය තැන්පත් කළ යුතුය.

6. නිසි පරිදි සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ලංසු අයදුම්පත් 2025.07.21 දින ප.ව.2.00 ට පෙර ධීවර ,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය,කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ 02 වන මහලේ මුදල් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කල යුතුය. ලංසු බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ පිරිසුදු කිරීමේ සේවාව සැපයීම - 2025/2026 යනුවෙන් සඳහන් කළ යුතුය.

7. 2025. 07.21 පස්වරු 2.00 ට මිල ගණන් භාර ගැනීම අවසන් වූ වහාම අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ 02 වන මහලේ මුදල් අංශයේදී ලංසුපත් විවෘත කරන අතර ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට ලංසු විවෘත කරන අවස්ථාවට සහභාගී විය හැක.

8. තවදුරටත් විස්තර අවශ්‍ය නම් එම විස්තර 0112382285 දුරකථන අංකය ඇමතීමෙන් ලබා ගත හැකිය.

සභාපති
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව
ධීවර ,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය